දේශසීමා නොමැති මාධ්‍යවේදියෝ සංවිධානය (Reporters without Borders) මගින් ඉදිරිපත් කරන ලෝක මාධ්‍ය නිදහස් දර්ශකයේ 2021 වසරේ දී ශ්‍රී ලංකාව 127 වෙනි ස්ථානයේ රැඳී සිටි අතර, 2022 වසර වන විට ශ්‍රී ලංකාව තවත් ස්ථාන 19 කින් පහළට වැටී 146 වෙනි තැනට පැමිණ සිටින බව එම වෙබ් අඩවිය වාර්තා කරයි.

මේ පිළිබඳව වාර්තා කරන මව්බිම පුවත්පත (මැයි 05, 2022), "ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස ස්ථාන 29 කින් පහළට" යන සිරස්තලය සමගින් මෙම පුවත වාර්තා කරයි. පුවත් අන්තර්ගතයේද සඳහන් වන්නේ ශ්‍රී ලංකාව "ස්ථාන 29 කින්" පහළට බැස ඇති බවයි.

මෙය හුදු මිනිස් දෝෂයක් විය හැකි වුවත්, ලෝක ශ්‍රේණිගත කිරීම් දර්ශකයක අප රට සිටින ස්ථානය වැනි පුවතක් වාර්තා කිරීමේදී නිරවද්‍යභාවය පිළිබඳ වඩාත් ඉහළ සැලකිල්ලක් අවශ්‍ය නොවන්නේ ද?

ඔබේ අදහස?

මූලාශ්‍ර: https://rsf.org/en/index